# Locator / Grid Locator / Location indicator

by 4S7VJ

පොළව මත යම් ස්ථානයක් නිවැරදිව සඳහන් කරනු ලබන්නේ අක්ෂාංශකය සහ දේශාංශකය මගිනි. නමුත් සමහර අවස්ථාවන්හිදී වර්ග කිලෝමීටර කීපයක් සහිත කුඩා ප්‍රදේශයක් සඳහන් කිරීමට භාවිත කරන තවත් ක්‍රමවේදයක් ඇත. එය Locator  නොහොත් Grid Locator  නොහොත් Location indicator යනුවෙන් හඳුන්වනු ලබයි.

මෙහිදී සම්පූර්ණ පෘථිවි පෘෂ්ඨයම කොටස් 1,86,62,400 කට, විශේෂ ක්‍රමයකට අනුව බෙදා වෙන් කරනු ලැබේ. ඒ සෑම කොටසක්ම සංකේත හයකින් නිරූපනය කරයි. පළමු හා දෙවන සංකේත, ඉංග්‍රීසි අකුරු දෙකකි. තුන්වන සහ හතරවන සංකේත, අංක දෙකකි. අවසාන සංකේත දෙකද, ඉංග්‍රීසි අකුරු දෙකකි. (උදාහරණ ලෙස මගේ නිවස අවට ප්‍රදේශය MJ96XW ලෙස දැක්විය හැකිය. මෙම ප්‍රදේශ දළ වශයෙන් සෘජුකෝණාස්‍රාකාර හැඩයක් ගනී.  ඒ හැම එකකම දිග අක්ෂාංශක රේඛාව දිගේ (නැගෙනහිර - බටහිර)  මනිනු ලබන කලා 5ක් ($00^0$ 05’ 00” ) වන අතර පළල, දේශාංශක රේඛාව දිගේ (උතුර - දකුණ ) මනිනුලබන කලා 2.5 ක ( $00^0$ 02’ 30” ) දිගකි.

**<u>බෙදා වෙන්කරන ක්‍රමවේදය:-</u>**

පළමු සංකේතය ආරම්භ වන්නේ බටහිර දේශාංශක $180^0$ නි. අවසාන වන්නේ නැගෙනහිර නැගෙනහිර දේශාංශක $180^0$ නි. එනම් එකම එක දේශාංශක රේඛාවකිනි. ඒවා පළමු රූපසටහනේ දැක්වෙන පරිදි අංශක 20 ක කොටස් 18 කින් සමන්විත වන අතර ඒ හැම පරාසයක්ම A සිට R දක්වා වූ ඉංග්‍රීසි අකුරකින් හඳුන්වනු ලබයි. උදාහරණයක් ලෙස M වලින් දක්වන්නේ නැගෙනහිර දේශාංශක $60^0$ සිට $80^0$ දක්වා ප්‍රදේශයයි.

දෙවැනි සංකේතයද,  A සිට R දක්වා වූ ඉංග්‍රීසි අකුරකින් හඳුන්වනු ලබන අතර ආරම්භ වන්නේ දක්ෂිණ ධ්‍රැවයෙනි, එනම් දක්ෂිණ අක්ෂාංශක $90^0$ නි. අවසාන වන්නේ උත්තර ධ්‍රැවයෙන් හෙවත් උතුරු අක්ෂාංශක $90^0$ නි. ඒ අතරතුර පෙදෙස අංශක 10 යේ කොටස් 18 කට වෙන්කර ඇත. උදාහරන ලෙස J අකුරෙන් දැක්වෙන්නේ නිරක්ෂ රේඛාවේ සිට උතුරු අක්ෂාංශක $10^0$ දක්වා වූ පෙදෙසයි.

මේ අනුව පළමු සහ දෙවන සංකේත වලට අදාල ප්‍රදේශ 324 ක් ඇත. ( 18x18 = 324 ) ඒවාට අදාල සංකේත යුගල 324 මෙසේ දැක්විය හැකිය. ( AA, AB, …AR,  BA, BB,…BR, ……RA, RB, ….RR ). පහත රූපයේ දැක්වෙන MJ නම්වූ ප්‍රදේශය, ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ ආශ්‍රිත පෙදෙසකි.



3වැනි සහ 4වැනි සංකේත

ඉහත කී අයුරු ඇති සෑම ප්‍රදේශයක්ම නැවතත් කොටස් සියයකට බෙදා ඇත. අක්ෂාංශකයට සමාන්තරව (එනම් නැගෙනහිර - බටහිර එල්ලේ) ඇති දුර ප්‍රමාණය අංශක 2 ක සමාන කොටස් දහයකට බෙදා ඒවා 0, 1, 2, ....,9 ලෙස නම්කර ඇත. එලෙසම දේශාංශකයට සමාන්තරව ඇති දුර අංශක එකකට සමාන කොටස් දහයකට බෙදා ඒවාද 0, 1, 2, ....,9 ලෙස නම්කර ඇත.

මේ අනුව පහත රූපසටහනේ පහළම පේළියේ ඇති ප්‍රදේශ දහය, 00, 01, 02, 03, 04, 05, 06, 07, 08, 09 ලෙස නම්කර ඇත. එලෙසම (ඊට ඉහළ) දෙවැනි පේළිය 10, 11, ...., 19 ලෙසද, මේ ආදී වශයෙන් ඉහළම පේළිය 90, 91, ...., 99 වශයෙන්ද නම්කර ඇත.




5 වැනි සහ 6 වැනි සංකේත

ඉහත සඳහන් ආකාරයේ සෑම පෙදෙසක්ම පහත රූපයේ දැක්වෙන පරිදි නැවතත් තවත් කුඩා ප්‍රදේශ 576 කට බෙදා ඇත. ඒ මෙසේය. අක්ෂාංශකයට සමාන්තරව (රූපයේ තිරස්ව) ඇති අංශක 2 ක් වූ දුර ප්‍රමාණය කලා පහක ( 5’) කොටස් 24 කට බෙදා ඇත. ඒවා A, B, C,...X යනුවෙන් නම්කර ඇත. එලෙසම අංශක එකක් වූ අක්ෂාංශකයද, කොටස් 24 කට බෙදා ඇත. එකක දිග 2’ 30” (කලා 2 යි විකලා 30 කි.) ඒවාද, A, B, C,...X යනුවෙන් නම්කර ඇත.

ඒ අනුව මෙහි ඇති සම්පූර්ණ ප්‍රදේශ ගණන = 24x24 = 576. තවද ඒවා AA, AB, .....BA, BB, BC,....,XA, XB, ..., XX යන අයුරු නම්කර ඇත.

මේ අනුව පෘථිවි පෘෂ්ඨයේ ඇති සම්පූර්ණ ප්‍රදේශ ගණන = 324 x 100 x 576 = 1,86,62,400 ක් වේ.

පළමුවැන්න AA00AA (දක්ෂින ධ්‍රැවය) වන අතර අවසාන කොටස RR99XX (උත්තර ධ්‍රැවය) වේ.

මෙම උදාහරණයෙන් දැක්වෙන්නේ මගේ නිවස ඇති ස්ථානයට (නැගෙනහිර දේශාංශක $79^0$ 56’ 16”, උත්තර අක්ෂාංශක $6^0$ 55’ 32” ) අදාල අගයයි. එනම් MJ96XW යන අගයයි. මෙය දේශාංශක ඔස්සේ නාවික සැතපුම් 5ක්

දිග, අක්ෂාංශකය ඔස්සේ නාවික සැතපුම් 2.5 ක් පළල සෘජුකෝණාශ්‍රාකාර පෙදෙසකි. ( නාවික සැතපුමක් දළ වශයෙන් අඩි 6080 කි. එනම් මීටර 1853 කි.)

